# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1811/3 - 2013 මැයි මස 20 වැනි සඳුදා - 2013.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම් වලට සහභාගී නොවීම හේතු කොට ගෙන පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

බෝවත්තේ ඉන්ද්‍රරතන හිමි නම් වූ සභිකයා අයත්වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන සේනානායක ඉසිලිගේ සුනිල් ශාන්ත සේනානායක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී මාතර ආච්චිගේ පද්මසිරි චන්ද්‍රවංශ පෙරේරා වන මම, සේනානායක ඉසිලිගේ සුනිල් ශාන්ත සේනානායක මහතා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. ඒ. පී. සී. පෙරේරා,
තේරීම්භාර නිලධාරී,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 15 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

06 - 07

1A - G 17683 — 350 (2013/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*